**දකුණු පළාත් සභාව**

**දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

**ලංසු සඳහා ආරාධනයයි**

**දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට ආහාර සැපයීමේ සේවාව පවත්වාගෙන යාම 2025 (SP/CS/NCB/24/07)**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුබද්ධ ගාල්ල වක්වැල්ලේ පිහිටි කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට 2025.01.19 දින සිට වර්ෂයක කාලයක් සඳහා ආහාර සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය වත්කමක් සහ අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් හා පළපුරුද්දක් සහිත සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

02. මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට කැමැත්තක් දක්වන සැපයුම්කරුවන් හට දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කර, 2024.11.18 දින සිට 2024.12.06 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුළ ආපසු නොගෙවන රු. 3,500.00 ක ලංසු ගාස්තුවක් ගෙවීමෙන් ගාල්ල එස්.එච්.දහනායක මාවතේ පිහිටි දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලංසු ලේඛන ලබා ගත හැකිය.

03. ලංසු ඉදිරිපත් කිරීමේදී **රුපියල් 200,000.00 ක් වටිනා 2025 මාර්තු මස 23 දින දක්වා** වලංගු ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ඕනෑම බැංකුවකින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් ලංසු ඇපකරයක් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සිය ලංසු පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය. මුදල්, චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මුද්‍රා තබන ලද මිල ගණන් පත්‍රිකා **2024.12.09** දින **ප.ව. 02.30** ට පෙර ලැබෙන ලෙස **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

05. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු අංකය **(SP/CS/NCB/24/07)** හා **" කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට ආහාර සැපයීම සඳහා මිල ගණන් 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය. මිල ගණන් විවෘත කිරීම ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 2024.12.09 දින ප.ව. 02.30 ට ප්‍රධාන ලේකම් කාර්යාලයේදී සිදු කරන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කරන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව සලකන්න.

සැ.යු. - ප්‍රසම්පාදන දැන්වීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියෙහි දිස්වනු ඇත.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

දුරකථන අංකය 091-4944016/ 0914946368
ඊ මේල් procurementplan1@gmail.com
දිනය : 2024.11.13